# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


---

මගේ අංකය / எனது இலக்கம் / My NO — 338 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 25/02/2024 පැය 0800

## මාධ්‍ය නිවේදනය

**01. පුද්ගලයෙකුට වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයකට තැත් කිරීමේ අපරාධයේ ආධාර අනුබල දුන් සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.**

2023.02.13 වන දින මෝදර පොලිස් වසමේ අවන්හලක ප්‍රධාන දොරටුව අසලදී එම අවන්හලේ කළමණාකරු හට ගිනි අවියකින් වෙඩි තබා ඝාතනය කිරීමට තැත් කිරීමේ අපරාධයට ආධාර අනුබල දුන් සැකකරුවකු 2024.02.24 වන දින උදෑසන කාලයේදී කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන මෝදර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 වන කොටහේන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු 2024.02.24 වන දින අලුත්කඩේ අංක 06 ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2024.03.05 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. එම සැකකරුගෙන් කරන ලද ප්‍රශ්න කිරීමේදී අනාවරණය වූ තොරතුරු මත මෙම වෙඩි තැබීමට ආධාර අනුබල දුන් තවත් සැකකරුවෙකු 2024.02.24 වන දින සවස් කාලයේදී **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 875** ක් සමඟ මෝදර පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් එම සැකකරු වයස අවුරුදු 36 වන ජාඇල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරුවන් පැමිණි ත්‍රිරෝද රථයක්ද පොලිසිය විසින් සොයා ගෙන ඇත. මෝදර පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. හෙරොයින් සමඟ සැකකරුවකු අත්අඩංගුවට - දෙමටගොඩ පොලිස් ස්ථානය.**

2024.02.24 වන දින සවස් කාලයේදී දෙමටගොඩ පොලිස් වසමේ ගුවන් පාලම අසලදී දෙමටගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් **වැටලීමක් සිදුකර හෙරොයින් ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 420 ක්** සමඟ සැකකරුවකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන බෝපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දෙමටගොඩ පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. හදිසි ගින්නක් - නල්ලතන්නිය පොලිස් වසම.**

2024.02.25 වන දින අළුයම් කාලයේ නල්ලතන්නිය පොලිස් වසමේ ලක්ෂපාන වතුයායේ පිහිටි නිවසක හදිසි ගින්නක් හටගෙන ඇති බවට නල්ලතන්නිය පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

ගින්නෙන් නිවස සම්පූර්ණයෙන් විනාශ වී ඇති අතර, ජීවිත හානි කිසිවක් නොමැත. ගින්න ඇති වීමට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත. නල්ලතන්නිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**